**ශීර්ෂය 161 - තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

### 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 161 - තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.9 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| | මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම.<br>2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම.<br>3. ප්‍රසම්පාදනයන් සැලසුම් නොකිරීම. | 2.5 (අ)<br>2.6<br>2.2.1 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු.<br>2. අනුකූල නොවීම්<br>3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.4<br>2.7<br>2.8 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br>2. කාර්යභාරයන් ඉටු නොකිරීම. | 2.2<br>2.1.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි | 1. මූල්‍ය හා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය කිරීමේ අඩුපාඩු | |

| | | | |
|---|---|---|---|
| | වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකායරක් සලසා තිබීම. | 2. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම<br>3. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම. | 2.3 (ආ)<br>2.3(ඇ)<br>2.3(ඈ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම. | 2.1.2 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | 1. සලසා තිබුණු ප්‍රතිපදන උපයෝජනය නොකිරීම.<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.5(ආ)(i)<br>2.5(ආ)(ii) |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් | මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම. | 2.9 |

ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1 .1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**(අ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමේ සූදානම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ අරමුණු සහ කාර්යභාරයන් ළඟා කර ගැනීම සඳහා තිරසර සංවර්ධන සභාවක් පිහිටවිය යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඊට අදාළ කටයුතු සිදුකර නොතිබුණි.

(ii) තිරසර සංවර්ධන අභිමථාර්ත 17 ක් සහ ඊට අනුබද්ධ ඉලක්ක 169 කින් සමන්විත මෙම ජාතික මට්ටමේ වැඩසටහන 2030 වන විට අවසන් කිරීමට නියමිත වුවත් මෙම කාල පරිච්ඡේදය ආවරණය කරමින් අදාළ අභිමථාර්ත ළඟා කර ගැනීමට හැකිවන අයුරින් සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබුණි.

(iii) එසේම මෙම අභිමථාර්ත ළඟා කරගැනීම සඳහා රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශයට පැවරී තිබූ නමුත් අදාළ ආයතනවල තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමට ගෙන තිබූ ක්‍රියාමාර්ග ඇගයීම සම්බන්ධයෙන් විධිමත් පියවරක් විගණිත දිනය වූ 2018 ජූනි මස 25 දින තෙක් ගෙන නොතිබුණි

(ආ) කාර්යසාධන වාර්තාවේ සඳහන් තොරතුරු පිළිබඳව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

**(i) පුත්තලම ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම**

සංචාරක කර්මාන්තය දියුණු කිරීම තුළින් ප්‍රදේශයේ ජනතාව සවිබල ගැන්වීම, ප්‍රදේශයේ ජෛව විවිධත්වය ඉහළ නැංවීම හා දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීමේ අරමුණු ඇතිව ආරම්භ කළ මෙම සැලැස්ම 2017 වර්ෂයේදී ආරම්භ කර 2018 වර්ෂයේ අවසන් කිරීමට නියමිත අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 500 කි. කෙසේ වෙතත් 2017 වර්ෂයේදී මේ සඳහා රු.මිලියන 2.5 ක් පමණක් වෙන් කර තිබුණි. මෙම ප්‍රතිපාදනයෙන් දැනුවත් කිරීමේ පුවරු 26 ක් සවිකිරීම හා දැනුවත් කිරීමේ අත්පත්‍රිකා බෙදා හැරීම සඳහා රු.මිලියන 2.46 ක් වැය කර තිබුණි.

**(ii) උතුරු පළාත් ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම**

ප්‍රදේශයේ සංචාරක විභවතාවයන් ඇති ස්ථාන හඳුනාගෙන පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම තුළින් ජනතාව සවිබල ගැන්වීමේ අරමුණින් 2017 වර්ෂයේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2021 දී අවසන්වීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වෙනුවෙන් රු.මිලියන 5 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් සහ පුහුණු වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කිරීම, පර්යේෂණ කටයුතු සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීම සහ පර්යේෂණ කටයුතු සඳහා උපකරණ බෙදා දීම පමණක් සිදුකර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 2.65 ක් වැය කර තිබුණි.

## 2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 මැයි 31 දින වනවිටත් සභාගත කර නොතිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

**ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 59.45 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 27.29 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන සැලැසුම් කිරීම සහ ප්‍රාරම්භක අවධිය**

මෙම අදියර යටතේ පහත සඳහන් සැලැසුම් හා ලියකිවිලි පිළියල කර නොතිබුණි.

(i) ප්‍රසම්පාදන පැකේජ සාරාංශය

(ii) ප්‍රාරම්භක ප්‍රසම්පාදන සැලැස්ම

**(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

2017 සැප්තැම්බර් 20 දින නිශ්චල ඡායාරූප ගැනීම සඳහා රු.578,100 ක් වටිනා කැමරාවක් මිලදී ගැනීමට ලංසු කැඳවීමේදී එක් සැපයුම්කරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණද එම සටහන්වල නොතිබුණු සැපයුම්කරුවෙකු වෙත ලංසුව පිරිනමා තිබූ බව නිරීක්ෂණය විය.

## 2.3 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

---

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් තොරතුරු දන්වා තිබුණද එම වත්කම්වල වටිනාකම් ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) මූල්‍ය කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය**

---

අමාත්‍යාංශය විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 06 ක් ලබා ගෙන තිබුණද අදාළ වාහන පිළිබඳ තොරතුරු හා නඩත්තු වියදම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර කල් බදු වාරික ගෙවීම් මුදල් අමාත්‍යාංශය මඟින් සිදුකරනු ලබයි.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය සතු වාහන 04 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ඈ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2018 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 ජූලි 05 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

---

අමාත්‍යාංශය විසින් ජීප් රථ 02 ක් හා කැබ් රථ 02 ක් බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වත්කම් ලබා දී තිබූ ආයතනය** | **වාහන වර්ගය හා ප්‍රමාණය** |
|---|---|
| සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය | ජීප් රථ 2 ක් |
| -එම- | කැබ් රථ 1 ක් |
| සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | කැබ් රථ 1 ක් |

**(ඊ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

---

අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශ සතු රු. මිලියන 28.9 ක් වටිනා වාහන 06 ක් විධිමත් අනුමැතියකින් තොරව පරිහරණයට ගෙන තිබුණි. තවද, විසර්ජන ගිණුමේ 2017 දෙසැම්බර් 31

දිනට අමාත්‍යාංශයට අයිති වාහනවල පිරිවැය වූ රු.මිලියන 294.04 ක් තුළ එම වාහන වටිනාකමද ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| අමාත්‍යාංශය | වාහන වර්ගය හා ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|
| | | රු.මිලියන |
| සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය | ජීප් රථ 1 ක් | 6.00 |
| රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | කාර් රථ 1 ක් | 4.80 |
| පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | කැබ් රථ 1 ක් | 6.00 |
| උද්භිද උද්‍යාන, විනෝදාත්මක හා පොදු කටයුතු අමාත්‍යාංශය | කාර් රථ 1 ක් | 7.50 |
| ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | කාර් රථ 2 ක් | 4.60 |
| | | 28.9 |

## 2.4 කළමනාකරණ දුර්වලතා

(අ) නිසි අධ්‍යයනයකින් හා අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව තිරසර සංවර්ධන සංකල්පය ප්‍රචලිත කිරීම වෙනුවෙන් රු.මිලියන 4.5 ක වියදමක් දරා පොත් 100,000 ක් හා සලකුණු 200,000 ක් මුද්‍රණය කර තිබුණි. එසේ වුවද ඉන් රු.1,245,000 ක් වටිනා පොත් 20,000 ක් හා සලකුණු 178,000 ක් 2018 ජූනි මස 25 දින වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි.

(ආ) තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ වාහන 02 ක නව ආසන සවි කිරීම සඳහා රු.350,000 ක් ගෙවා තිබූ අතර ගලවා ඉවත් කරන ලද ආසනවල වටිනාකම අඩුකර එම කාර්ය ඉටු කිරීමට අළුත්වැඩියා කරන ලද ආයතනය සමඟ එකඟ වී තිබුණි. කෙසේ වුවද අදාළ ඇස්තමේන්තුවලට එය ඇතුළත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 1991 අගෝස්තු 14 දින වනජීවී අධ්‍යක්ෂක හා සෙසු පාර්ශවකරුවන් විසින් අත්සන් කරන ලද ගිවිසුම අනුව ස්ථාපිත කර ඇති වනජීවී භාරයේ අවසන් ගිණුම් හා මූල්‍ය වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 03 ක කාලය තුළ සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| ------- | -------------- | ---------------- | ------------ | --------- | ------------------- |
| | | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2015 | පුනරාවර්තන | 100.70 | 91.15 | 9.55 | 9.4 |
| | මූලධන | 16.93 | 12.14 | 4.79 | 28.2 |
| | **එකතුව** | **117.63** | **103.29** | **14.34** | **12.1** |
| 2016 | පුනරාවර්තන | 174.36 | 166.31 | 8.05 | 4.6 |
| | මූලධන | 100.17 | 57.11 | 43.06 | 42.9 |
| | **එකතුව** | **274.53** | **223.42** | **51.11** | **18.6** |
| 2017 | පුනරාවර්තන | 177.82 | 174.22 | 3.60 | 2.0 |
| | මූලධන | 59.45 | 27.30 | 32.15 | 54 |
| | **එකතුව** | **237.27** | **201.52** | **35.75** | **15** |

**(අ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම**

-------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී සැලසුම් සහගතව ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයන් 20 කින් අවස්ථා 13 කදී රු.18,909,100 ක ප්‍රතිපාදන වරින් වර මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වෙනත් විෂයන් වෙත මාරු කර තිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

--------------------------------------------------

වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු.25,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

------------------------------

වැය විෂයයන් 5 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 100 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. එමෙන්ම වැය විෂය 03 කට අදාළව මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්වලට ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුවද රු.3,367,667 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**2.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 | පවත්වා නොතිබුණි. |
| (ඉ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

**2.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) | මුදල් රෙගුලාසි 104 | 2017 වර්ෂය තුළදී සිදුවූ අනතුරු 9 ක් වෙනුවෙන් ප්‍රාරම්භක වාර්තාවන් හා අලාභ හානිය සිදු වූ දින සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කල යුතු පූර්ණ වාර්තාවන් අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 1642 | 2017 වර්ෂයේ සිදුවූ හදිසි අනතුරු 05 ක් පොලිසියට පැමිණිලි කර පොලිස් වාර්තා ලබා ගෙන නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| | (i) 1992 අගෝස්තු 19 දිනැති අංක 25/95 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශය සතු සියළුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. |
| | (ii) 2006 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | වාහන 10 ක් සම්බන්ධයෙන් ලොග් සටහන් හා ධාවන සටහන් නිසි පරිදි යාවත්කාලීන කිරීම හා ඉන්ධන දහනයවීමේ ආර්ථිකවත් බව පරීක්ෂාකර නොතිබුණි. |

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### 2.8.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.78,627,975 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.836,468 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 17 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 51 | 41 | 10 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 31 | 30 | 01 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | එකතුව | 109 | 94 | 15 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**කාර්ය මණ්ඩල පුහුණු කිරීම**

තථ්‍ය සේවක සංඛ්‍යාව වූ 94 දෙනෙකුගෙන් 37 දෙනෙකුට කිසිදු පුහුණු අවස්ථාවක් ලබාදී නොතිබුණි.

## 2.9 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම, හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ

ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් අමාත්‍යාංශය විසින් අදාළ නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි.